# පිළිම් හෙලා නැති

" පේරාදෙණිය මල්වත්ත තිඹිරිගෙය කොටගෙන බිහිවූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මේ වන විට අවුරුදු 100 කට එහා ගිය අතීතයකට උරුමකම් ලබා තිබෙනවා "

වර්තමානයේ දී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව දිවයිනේ ප්‍රමුඛතම දෙපාර්තමේන්තුවක් බවට පත් වී තිබෙන අතර එහි විවිධ තරාතිරම්වලට අයත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සිට දෛනික වේතන ලබන කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවකයා දක්වා දහස් ගණනක පිරිසක් සේවය කරනවා.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දැක්ම වී තිබෙන්නේ කෘෂිකාර්මික විශිෂ්ටත්වය තුළින් ජාතික සෞභාග්‍ය උදාකර ගැනීමයි.

පසුගිය සියවසක කාලය තුළ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් වී, එළවළු, අතිරේක ආහාර බෝග, තෙල් බෝග, පලතුරු ආදි බෝග වර්ග පිළිබඳ නිරතුරු පර්යේෂණ පවත්වමින් නව ප්‍රභේද බිහි කිරීමත් බිහිකරන ලද නව ප්‍රභේද දෙපාර්තමේන්තු පර්යේෂණ ස්ථාන සහ ගොවිපලවල නිෂ්පාදනය කොට ජනතාව අතට පත්කොට තිබෙනවා.

ඒ අනුව පසුගිය සියවස තුළ සැබෑ ශ්‍රී ලාංකේය රසය රැගත් දේශිය එළවළු, පලතුරු ඇතුළු ආහාර බෝග රාශියක් ජාතියට දායාද කොට ඇති අතර අද ද ශ්‍රී ලාංකේය ජනතාව අතර ඒවා ජනප්‍රිය මට්ටමින් භාවිතයේ පවතිනවා.

ඒ අතරින් උදාහරණ කිපයක් ලෙස එම්. අයි. මිරිස්, දඹුල්ල බී ලූනු, බතලගොඩ වී, තින්වේලි බටු ආදිය දැක්විය හැකියි. කෙසේ වෙතත් පසුගිය සියවසක කාලය තුළ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ජාතියට දායාද කරදුන් සැබෑ ශ්‍රී ලාංකේය රසය ඇතුලත් විවිධ ආහාර බෝග වල පසුබිම් කතාව පිළිබඳ අවබෝධයෙන් යුතුව කටයුතු කිරීම ඔබ අප කාටත් ප්‍රයෝජනවත් වනු ඇති.

නව බෝග ප්‍රභේද බිහි කිරීමේදී ඒ පිළිබඳව දීර්ඝ කාලයක් විවිධ පර්යේෂණ කටයුතු සිදුකල යුතු වෙනවා. එය බොහෝ දුරට සිදුවන්නේ වගා ක්ෂේත්‍ර තුලදී. එහි මූලික වගකීම දරණු ලබන්නේ පර්යේෂණ නිලධාරීන් විසිනුයි. ඊට අමතරව විවිධ ශ්‍රේණි වලට අයත් තාක්ෂණ නිලධාරි කණ්ඩායම් සහය සේවාවන් සපයනවා. කෙසේ වෙතත් එම පර්යේෂණ කටයුතු ආරම්භයේ සිට අවසානය දක්වා දිගු කාලසීමාවක් නඩත්තු කරගෙන යාම වෙනුවෙන් අවශ්‍ය වන ශ්‍රමය සුළුපටු නොවේ. ඒ සඳහා යොදවනු ලබන්නේ එම ආයතන වල සේවය කරන කණිෂ්ඨ කාර්ය මණ්ඩලය වන අතර මෙම කාර්යයන් සඳහා වැඩිපුරම ශ්‍රමය සපයන්නේ එම සේවක පිරිසයි.

# විරුවන් පිරිසක්

නව බෝග ප්‍රභේදයක් ජාතියට දායාද කිරීමෙන් පසු ඇගයීමට ලක්වෙන්නේ එහි මූලික වගකීම දැරූ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි මහතා හෝ මහත්මියයි. ඔවුන්ගේ සේවා උසස් වීම් මෙන්ම සේවා කාලය තුළ හිමි වන වරප්‍රසාද සඳහා ද ඔවුන්ගේ එම සේවාව සැලකිල්ලට ගනු ලබනවා. මෙම කාර්යයන් සඳහා සහයවූ අනෙකුත් නිලධාරි පිරිසටත් ඇතැම් අවස්ථාවල දී යම් යම් සේවා ප්‍රතිලාභ ලැබීමට අවස්ථාව උදාවී තිබෙනවා.

නමුත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනුලබන සියළුම කාර්යයන් වලදී තම උපරිම ශ්‍රම දායකත්වය ලබාදී කටයුතු කරනු ලබන කණිෂ්ඨ කාර්ය මණ්ඩලයට 2014 වර්ෂය වනතුරු කිසිදු සැළකිය යුතු වරප්‍රසාදයක් නොලැබී ගියා.

ඒ අනුව 2014 වසරේ ඔක්තෝම්බර් මස 24 දින එවකට පැවති රජය විසින් ගනු ලැබූ තීරණයකට අනුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් දිවයින පුරා පිහිටි විවිධ සේවා ස්ථානයන්හි වසර ගණනාවක් කොන්ත්‍රාත් සේවකයින් ලෙස තම දහඩිය කඳුළු වගුරමින් සේවය කළ සේවකයින්ට සේවා ස්ථීරත්වය උත්සවාකාරයෙන් ප්‍රධානය කෙරුණා. එම අවස්ථාවට පසුගිය රජයේ ගරු කෘෂිකර්ම අමාත්‍ය තුමා අමාත්‍යාංශ ලේකම් තුමා ඇතුළු අමාත්‍යංශ නිලධාරින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරින් ඇතුළු විශාල පිසක් සහභාගි වී සිටියා.

මෙම පත්වීම් ප්‍රධානය කිරීමේ උත්සව සභාව ඇමතූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වර්තමාන කෘෂිකර්ම අධ්‍යක්‍ෂ ජනරාල් ආචාර්ය රොහාන්




කොන්ත්‍රාත් සේවකයින්ට උත්සවාකාරයෙන් ස්ථිර පත්වීම් ප්‍රධානය කළ අවස්ථාවේදී කෘෂිකර්ම අධ්‍යක්‍ෂ ජනරාල් ආචාර්ය රොහාන් විජේකෝන් මහතා 2013 වසරේදී හඳුන්වාදුන් හොරණ පැපොල් දෙමුහුම් 01 ප්‍රභේදය පිළිබඳ සභාවට විස්තර කරමින්. . .

විජේකෝන් මැතිතුමා 2013 වසරේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ජාතියට දායාද කෙරුණු නව බෝග ප්‍රභේද රැසක් හඳුන්වා දෙනු ලැබුවා.

සැබෑ ශ්‍රී ලාංකේය රසය ඇතුළත් මෙම බෝග ප්‍රභේද නිෂ්පාදනය කිරීම සඳහා කැපවූ සියළුම නිලධාරීන්ටත් එම කටයුතු වලට දායකත්වය සැපයූ කණිෂ්ඨ සේවක මණ්ඩලයටත් ඔහු සිය ස්තුතිය පුදකර සිටියා. එහිදී කෘෂිකර්ම අධ්‍යක්‍ෂ ජනරාල්වරයා දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ කාර්ය මණ්ඩලය පසුගිය සියවසක කාලය තුළ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙනුවෙන් සිදුකරන ලද සේවාව විශේෂ ඇගයීමකට ලක්කරනු ලැබුවා. ඔවුන් හෙලූ දහදිය සැබෑ ශ්‍රී ලාංකේය රසය ඇතුළත් බෝග ප්‍රභේද හා මුසුවී සමස්ථ ශ්‍රී ලාංකේය ජාතියට ජීවය ලබාදුන් ඔවුන්ට ජාතියේ උපහාරය හිමි විය යුතු බවත් ප්‍රකාශ කර සිටියා. සැබැවින්ම මෙම අවස්ථාව කෙතරම් හැඟිම්බර වුවාද යත් ඊට සහභාගි වූ බොහෝ දෙනෙකුගේ දෑස් කඳුළින් තෙත් වනු දැක ගන්නට හැකි වුනා. කණිෂ්ඨ කාර්ය මණ්ඩලය විසින් සිදු කරන සේවාව නොතකමින් කටයුතු කරන ඇතැම් නිලධාරීන්ට යථාර්ථය අවබෝධ කරවීමට එම කථාව වැදගත් පණිවුඩයක් වන්නට ඇති.


ගෙවුන සියවස තුළ දෙපාර්තමේන්තුව වෙනුවෙන් දහය හෙලූ සේවකයන් දහස් ගණනකට දෙපාර්තමේන්තුව හා සම්බන්ධ අනන්ත අප්‍රමාණ අත්දැකීම් සම්භාරයක් තිබිය හැකියි. ඒවා පලකිරීම සඳහා පිටු සියයකින් යුතු පොත් දහස් ගණනකින් වත් නොහැකි වනු ඇති. කෙසේ වෙතත් බෝග නිෂ්පාදනයට සෘජුව සම්බන්ධයක් නොතිබුණු කණිෂ්ඨ සේවක මහතකුගේ තම සේවා අත්දැකීම් ගොවිකම් සඟරාවට මුසු කිරීම තුලින් ඔවුන්ගේ සේවය පිළිබඳ අවබෝධයක් ඔබට ලබා ගත හැකි වන බව අපේ විශ්වාසයයි. ඔහුගේ කථා වස්තුව



2013 වසරේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් රටට දායාද කළ නව බෝග ප්‍රභේද කිහිපයක් . . .

මෙසේ ඔබ වෙත ගෙන ඒමට අපි උත්සහ ගත්තා. මේ ඔහුගේ කතාවයි.

''මගේ නම ලොකුහෙට්ටිගේ දොන් වේලාරත්න. මම ඉපදුනේ 1946 වසරේදී මම දැනට පදිංචිව සිටින්නේ මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව


එල්. ඩී. වේලාරත්න මහතා

ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ උඩුවාවල ග්‍රාම නිලධාරි කොටසේය. ගමේ පාසලෙන් කනිෂ්ඨ අධ්‍යාපනය ලබා 1964 වසරේදී පොළොන්නරුව ප්‍රදේශයේ පදිංචිය සඳහා ගියා. රැකියාවක් අපේක්ෂාවෙන් කම්කරු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී පොළොන්නරුව රජයේ ගොවිපලේ කන්න පදනමට රැකියාවකට ගියා. තාවකාලික කම්කරුවෙකු වශයෙන් සේවය කිරීම ආරම්භ කලා.

වෙන ආයතන වල සම්මුඛ පරීක්ෂණ කිපයකට ඉදිරිපත් වුවත් නොයෙකුත් හේතු මත රැකියා අවස්ථා හිමි වුයේ නැති නිසා දිගටම ගොවිපලේ කම්කරු පදනමට වැඩ කලා. ඒකාලේ දවස් පඩිය රුපියල් 2.80 යි. වැඩ වැඩි කාලයට දිසාපතිතුමාගේ අනුමැතියෙන් දවස් පඩිය රු. 3.50 ක් වුනා. මේ අතරතුරේදී 1970 දී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සිවිල් ඉංජිනේරු අංශයේ කම්කරු තනතුරකට මා තෝරාගෙන තිබුණා.

මුලින්ම තෝරා ගත්තේ අනියම් පදනම මත දෛනික වැටුප් ලැබීමේ පදනම මතයි. මගේ මුල් සේවා ස්ථානය වුයේ පොළොන්නරුව F.R.D හෙවත් Field Repair Depoart ආයතනයයි. එම ආයතනය ක්ෂේත්‍ර අළුත්වැඩියා මධ්‍යස්ථානය නමින් හැඳින්වුවා.

එවැනි වැඩපලවල් තුනක් ඒ කාලයේ ලංකාවේ තිබුණා. පොලොන්නරුව, සිතාඑළිය හා අම්බලන්තොට යන ප්‍රදේශ වලයි. එම ආයතන වල කාර්යය භාරය වුයේ අදාළ බල ප්‍රදේශයේ ඇති කැලෑ එළිපෙහෙලි කිරීම හා දෙපාර්තමේන්තුවේ ගොවිපලවල් වල ඉඩම් සංවර්ධන කටයුතු කිරීමයි. මා එම ආයතනයට සම්බන්ධව ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු වලට සහය කම්කරුවෙකු ලෙස සේවය කලා.

එවකට සත්ව පාලන කටයුතු සඳහා වෙනම දෙපාර්තමේන්තුවක් තිබුනේ නෑ. සත්ව පාලන කටයුතු සිදු උනේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සත්ව පාලන අංශය මඟිනුයි. ඒ අනුව පොලොන්නරුව සත්ව ගොවිපලට අනුබද්ධව කන්දකඩුව හා ත්‍රිකෝණමඩුව යන ප්‍රධාන සත්ව ගොවිපලවල් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව බාරයේ පැවතුණා. ඒවායේ සියගණන් කම්කරුවන් සේවයේ යොදවා තිබුණා.

1960 දශකයේ මුල් භාගයේදී පොලොන්නරුව ගොවි ජනපද වලට රට පෝර හා කෘෂිරසායන බේත් හඳුන්වා දී තිබුණා. ඒවා එවකට සිදුවුයේ දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ත නිලධාරිතුමා ඇතුළු කෘෂිකර්ම ව්‍යාප්ති කාර්යය මණ්ඩලයෙනුයි. ඒ කාලයේ කෘෂිකර්ම අමාත්‍යාංශයට ඉඩම් හා වාරිමාර්ග යන අංශය සම්බන්ධව තිබුණා. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට බිත්තර වී ගොවිපලවල් රාශියක් තිබුණා. පොලොන්නරුව හා හිඟුරක්ගොඩ යන බිත්තර වී ගොවිපලවල් ඒ පළාතේ තිබුණා. ඒ අළුත් වී වර්ග වැඩි වශයෙන් හඳුන්වා දුන් යුගයයි.

ඒ කාලයේ ගොවිපල් අංශය මඟින් පලතුරු පැළ නිෂ්පාදනය ද හොඳින් සිදුවුණා. ඒවා ජනතාව අතර වේගයෙන් ජනප්‍රිය වුනා. බද්ධ අඹ

පැළයක් රු. 2.50 කට අලෙවි කෙරුණු අතර කර්තකොලම්බන්, වෙල්ලෙයිකොලොම්බන්, විලාඩි ආදිය පොලොන්නරුවේ ගොවි මහතුන් තම ගෙවතු වල වගා කිරීමට උනන්දු වූ බව පෙනුණා. ඒකාලයේ පොලොන්නරුවේ ඇතැම් දක්ෂ ගොවි මහතුන් නව වී වර්ග වගා කර අක්කරයට බුසල් 140 - 150 පමණ අස්වනු ලබා ගත් බව අසන්නට ලැබුණා.

1973 දී මම අනුරාධපුර පුලියන්කුලම ගොවිපල් යාන්ත්‍රික පුහුණු ආයතනයේ ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු වලට සම්බන්ධ උනා. ඒ සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට බටහිර ජර්මන් රාජ්‍යයෙන් ආධාර හිමි වී තිබුණා. ගොවිපල් යන්ත්‍ර භාවිතය පිළිබඳ නිලධාරීන් හා ගොවීන් පුහුණු කිරීම සඳහා ඒකාලයේ ජර්මන් ජාතික මහත්වරු 4 දෙනෙක් එම ආයතනයේ සේවය කලා.

1975 කාලයේදී මම පැල්වැහැර ප්‍රායෝගික ගොවිකම් පාසල හා එහි පරිශ්‍රය ආසන්නයේ තිබුණු වී ගබඩාවේ ඉදිකිරීම් කටයුතු වලට සම්බන්ධ උනා. ඉන් අනතුරුව 1977 දී කුරුණෑගල නගරයේ තිබුණු කුරුණෑගල දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති කාර්යාලය ගොඩනැංවීමේ කටයුතු වලටත්, බතලගොඩ වී පර්යේෂණ ආයතනයේ ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු වලටත් සහභාගි උනා.

1978 අවුරුද්දේදී මා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ ඉංජිනේරු අංශයට පැමිණියා. එහි යාන්ත්‍රික හා සිවිල් අංශ ඒකාබද්ධව පවත්වාගෙන ගියා. ඒකාලයේ එල්. එස්. එස්. විජයසුන්දර මහත්මයා ඉංජිනේරු අධිකාරී (සිවිල්) වශයෙන් සේවය කලා. ඒ කාලයේදී මම දැනට ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය යන නමින් හඳුන්වන එවකට පාංශු ජල පරිශීලන අංශය නමින් හැඳින්වූ ආයතනයට වරින් වර සම්බන්ධවී විවිධ ඉදිකිරීම් කටයුතු වලට සම්බන්ධ වුනා. එම ආයතනය ඇති කිරීමට මුල්වූයේ කීර්තිමත් නිලධාරියෙකු වූ ආචාර්ය සි.ආර්. පානබොක්කේ මැතිතුමායි. පාංශු හා ජල පරිශීලන අංශයේ ප්‍රථම ප්‍රධාන නිලධාරී තැන වූයේ ආචාර්ය එස්. සෝමසිරි මහතායි.

1988 පමණ වන විට මම සේවා අවශ්‍යතාවය මත පාංශු හා ජල පරිශීලන අංශයට ස්ථිර ලෙසම සේවය සඳහා සම්බන්ධ උනා. එම ආයතනය මහා පරිමාණ සංවර්ධන යෝජනා ක්‍රම වල පාංශු සමීක්ෂණ කටයුතු, ජල කළමණාකරන කටයුතු, පාංශු බාදන පර්යේෂණ කටයුතු, කෘෂි කාලගුණික කටයුතු ආදී විෂයන් පිළිබඳව දීප ව්‍යාප්තව සේවය සැපයූ ආයතනයක්. මම එම ආයතනයට සම්බන්ධවී ඉහත පර්යේෂණයන්ට අදාළ ගොඩනැගිලි හා පර්යේෂණ



සඳහා අවශ්‍ය ව්‍යුහයන් ගොඩනැගීම් කටයුතු ඉටු කළා. උතුරු නැගෙනහිර ඇතුලු බොහෝ ප්‍රදේශ වලට ගොස් තාවකාලිකව නවාතැන් ගෙන සිදුකරන ලද රාජකාරි පිළිබඳ සිහියට නැගෙනවිට මට මහත් සතුටක් දැනෙනවා.

ඒ කාලයේදී ආචාර්ය එස්. සෝමසිරි මහතා, ආචාර්ය සෝමපාල මහතා, ආචාර්ය එච්. බී. නායකකෝරාළ මහතා, පර්යේෂණ නිලධාරි ආනන්ද වික්‍රමසිංහ මහතා, ආචාර්ය ජේම්ස් හඳවල මයා, පර්යේෂණ නිලධාරිනි කන්නන්ගර මහත්මිය ආචාර්ය පුණ්‍යවර්ධන මයා පර්යේෂණ නිලධාරි කපිල මුණසිංහ මයා, පර්යේෂණ නිලධාරි බණ්ඩාර මයා යන මහත්වරුන්ගේ ගුරුහරුකම් අනුව ඔවුන් විසින් සිදුකරන ලද විවිධ පර්යේෂණ කටයුතු වලට සහය වීමට හැකි උනා. 2002 වසරේදී අම්බුළුවාව ජාතික ජෛව විවිධත්ව උද්‍යානයේ සංවර්ධන කටයුතු ආරම්භ වීමත් සමඟ එහි පස සංරක්ෂණ කටයුතු සඳහා සහාය වුනා. පසුව එම උද්‍යානය පාලනය කෙරුණු රාජකීය උද්භිද උද්‍යානයේ සේවය සඳහා මා යොදවනු ලැබුවා.

කෙසේ වෙතත් 2006 පෙබරවාරි මාසයේදී පුරා වසර 36 ක සේවා කාලයකට පසු මා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සේවයෙන් විශ්‍රාම ගනු ලැබුවා.

ඒ අනුව මා හට මුලින් කන්න පදනම මත සේවය කල කම්කරුවෙකු ලෙසත් පසුව අනියම් කම්කරුවෙකු ලෙසත් අනතුරුව ස්ථිර කම්කරුවෙකු ලෙසත් 1973 දී පෙදරේරුවකු ලෙසත් උසස් වීම් ලබා 2006 වන විට පළමු ශ්‍රේණියේ පළමු පන්තියේ පෙදරේරුවකු ලෙස විශ්‍රාම යාමට හැකි උනා.

මගේ සේවා කාලය තුළ මා කම්කරු වෘත්තිය සමිති කටයුතු වලටත් සම්බන්ධ උනා. අපේ රටට ජීවය දෙන ගොවි ජනතාව සමඟ අත්වැල් බැඳගනිමින් ජාතික සේවයක් සිදුකරන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ සේවකයෙකු වශයෙන් සේවය කිරීමට හැකි වීම මගේ භාග්‍යයක් සේ මම සලකනවා''

තම වෘත්තිමය තොරතුරු ගොවිකම් සඟරාවට ලබාදුන් දැනට විශ්‍රාම ජීවිතයේ සැදෑ සමය ගත කරන එල්. ඩී. වේලාරත්න මහතාට ගොවිකම් සඟරාව වෙනුවෙන් නිදුක් නිරෝගී දීර්ඝායුෂ ප්‍රාර්ථනා කර සිටින අතර රටට ජීවය දෙන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජීවනාලිය වූ කණිෂ්ඨ සේවක කාර්යය මණ්ඩලයට මෙම ලිපිය උපහාරයක් වේවායි ප්‍රාර්ථනා කරමු.

ගොවිකම් සඟරාවේ අපි වෙනුවෙන්,
වී. වී. බස්නායක - මූලස්ථාන කෘෂිකර්ම උපදේශක,
කෘෂිකර්ම ප්‍රකාශන ඒකකය, ගන්නොරුව

